// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2267/59 - 2022 පෙබරවාරි මස 18 වැනි සිකුරාදා - 2022.02.18
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1987 අගෝස්තු මස 18 වැනි දින අංක 467/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 1987 අංක 290 දරන ආඥාවේ කැබලි අංක 1 සිට 40 ලෙස සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි 1 වන උප ලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්.එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 03/J/84/LG/256 I&II
අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: ME/ACG/84/F/763
2022 පෙබරවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය
මිහිකත මැඳුර,
ඉඩම් මහලේකම් කාර්යාලය
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

1A - G 36109 - 25 (2022/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ සුදුවැල්ල (කලාප අංක 24 කොළඹ මහනගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංකඃ මු.පි.කො. 7963 හා 1998.09.10 දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0051 ක් වන ඩීන්ස් පාරේ වරිපනම් අංක 464 නැමැති ඉඩම් කැබලි 02 (දෙකට) මායිම්ඃ

01. **කැබලි අංක 98 1/2 - ඉඩමේ නම - ඩීන්ස් පාරේ වරිපනම් අංක 464 - ප්‍රමාණය හෙක්. 0.0003 ක් පමණ**

| | | |
|---|---|---|
| උතුරට | : | මු.පි.කො.7653හි 93 වැනි කැබැල්ල, මෙම පිඹුරේ 94 සහ 95 වැනි කැබලි; |
| නැගෙනහිරට | : | 95 සහ 97 1/2 වැනි කැබලි; |
| දකුණට | : | 98 2/2 වැනි කැබැල්ල; |
| බටහිරට | : | ඩීන්ස් පාරේ වරිපනම් අංක 464. |

02. **කැබලි අංක 98 2/2 - ඉඩමේ නම - ඩීන්ස් පාරේ වරිපනම් අංක 464 - ප්‍රමාණය හෙක්.0.0048 ක් පමණ**

| | | |
|---|---|---|
| උතුරට | : | ඩීන්ස් පාරේ වරිපනම් අංක 464 සහ 98 1/2 , 97 1/2 වැනි කැබලි; |
| නැගෙනහිරට | : | 97 2/2 වැනි කැබැල්ල; |
| දකුණට | : | 100,99, සහ 102 වැනි කැබැලි; |
| බටහිරට | : | ඩීන්ස් පාරේ වරිපනම් අංක 464. |

EOG 02 - 0534

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.